Australian Human Rights Commission

# පැමිණිල්ලක් කිරීම

ඕසේට්‍රලියානු මානව හිමිකම් කොමිෂන් සභාව යනු නීතිවිරෝධී ලෙස ස්ත්‍රී පුරුෂ බව, ජාතිය, ආබාධිත බව, වයස හේතුවෙන් වෙනස් කොට සැලකීම, ILO III ලෙස වෙනස් කොට සැලකීම සහ මානව අයිතිවාසිකම් කඩ කිරීම පිළිබඳ පරීක්ෂා කර විසඳුම් ලබා දෙන ස්වාධීන ආයතනයකි.

## අපට පැමිණිලි කළ හැක්කේ කුමක් ගැනද

- *ලිංගිකත්වය අනුව වෙනස් කර සැලකීම* යන්නට ස්ත්‍රී පුරුෂ බව, ලිංගික අනන්‍යතාව, අන්තර් ලිංගික බව, ගර්භණී බව, විවාහක හෝ සම්බන්ධතා තත්ත්වය, මව්කිරි දීම, පවුලේ වගකීම සහ ලිංගික සම්භවය මත පදනම් වෙමින් හිංසා කිරීම සහ පහත් කොට සැලකීමයි.
- *ආබාධිත බව අනුව වෙනස් කොට සැලකීමට* ශාරීරික, බුද්ධිය, සංවේදී බව, ඉගෙනීමේ සහ මානසික ආබාධිත බව; රෝග හෝ අසනීප; වෛද්‍ය හේතු; වැඩ හා අදාළ තුවාල සිදුවීම්; අතීත, වර්තමාන සහ අනාගත ආබාධිත බව සහ ආබාධිත පුද්ගලයකු සමඟ සම්බන්ධතාවක් තිබීම හේතුවෙන් පහත් කොට සැලකීම ඇතුළත් වේ.
- *ජාතිය අනුව වෙනස් කර සැලකීමට* ජාතිවාදී වෛරය සහ ජාතිය, වර්ණය, සම්භවය, ජාතික හෝ ජන වාර්ගික සම්භවය, සංක්‍රමණික තත්ත්වය අනුව වෙනස් කර සැලකීම ඇතුළත් වේ.
- *වයස අනුව වෙනස් කර සැලකීමට* වයසින් වඩාත් අඩු වීම හෝ වැඩි වීම මත වෙනස් ආකාරයට සැලකීම ඇතුළත් වේ.
- ***ILO III** වෙනස්* ආකාරයට සැලකීමට ආගම, අපරාධකාරී වාර්තාව, වෘත්තීය සමිති ක්‍රියාකාරීත්වය, දේශපාලන මතය සහ සමාජ සම්භවය අනුව වෙනස් ආකාරයට සැලකීමට ඇතුළත් වේ.
- *මානව අයිතිවාසිකම් යන්නට සිවිල්* සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය, ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ ආබාධිත අයගේ අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය වැනි ජාත්‍යන්තර මානව අයිතිවාසිකම් සම්මුතීන් කඩ කිරීමක් ලෙස ජනරජය මගින් සලකන ක්‍රියාකාරකම් වේ.

ඔබ ඔසේට්‍රලියාවේ කොතැන සිටියද පැමිණිල්ලක් කිරීමට හැකියාව ඇති අතර ඒ සඳහා ඔබට වියදමක් දැරීමට සිදු නොවේ. පැමිණිලි කරන ආකාරය පහත දක්වා ඇත.

## විමසීමක් කිරීම

- ඔබට යමක් පිළිබඳ විශ්වාසයක් නැත්නම් ද යමක් ගැන පැමිණිලි කිරීමට අවශ්‍ය නම්ද දුරකථනයෙන් අංක **1300 656 419** අමතන්න. නැතහොත් complaintsinfo@humanrights.gov.au ලිපිනයට ඊමේල් කරන්න.
- ක්‍රියාවලිය ආරම්භ කිරීමට ඔබට පැමිණිලි ආකෘති පත්‍රයක් එවීමට අපට හැක.
- අපට ඔබට උදව් කළ නොහැකි නම්, උදව් කළ හැකි අයකු වෙත අපි ඔබ යොමු කරමු.

## පැමිණිල්ලක් කිරීම

- පැමිණිල්ල ලිඛිතව කළ යුතුය. ඔබ පැමිණිලි ආකෘති පත්‍රය භාර දී අපට තැපැල් කිරීමට හෝ ෆැක්ස් කිරීමට හැක. එසේත් නැත්නම් අපේ වෙබ් අඩවියේ මාර්ගගතව පැමිණිල්ලක් කළ හැක. (www.humanrights.gov.au)
- ඔබ කැමති භාෂාවකින් පැමිණිල්ල කළ හැකි අතර අවශ්‍ය නම් පැමිණිල්ල ලියා ගැනීමට අපට ඔබට උපකාර කළ හැක.
- පැමිණිල්ලක් කිරීමට නීතිඥයකු අවශ්‍ය නොවේ.
- ඔබේ පැමිණිල්ල පිළිබඳ කටයුතු කළ නොහැකි නම් ඊට හේතුව අපි විස්තර කරමු.

## පරීක්ෂණය

- ඔබේ පැමිණිල්ල ගැන සාකච්ඡා කිරීමට අපි ඔබ අමතමු. ඔබෙන් වැඩිදුර තොරතුරු සපයන ලෙස ඉල්ලා සිටිය හැක.
- සාමාන්‍යයෙන් කොමිසම විසින් ඔබ පැමිණිලිකරන පුද්ගලයා හෝ සංවිධානය අමතන අතර ඔබේ පැමිණිලේල් පිටපතක් සපයා අදහස් සහ අනෙකුත් විස්තර ඔබෙන් ඉල්ලා සිටිනු ඇත. ඔබේ පැමිණිල්ලට ප්‍රතිචාර වශයෙන් ඔවුන් පැවසුවේ කුමක්ද යන්න අපි ඔබට දැන ගැනීමට සලස්වමු.
- සමහර අවස්ථාවල ඔබේ පැමිණිල්ල සම්බන්ධයෙන් කටයුතු නොකිරීමට අපි තීරණය කරනු ඇත. මෙය සිදු වුවහොත් ඒ ඇයිදැයි යන්න අපි විස්තර කරමු.
- පැමිණිල්ල සම්මුතියක් මගින් විසඳා ගැනීමට උත්සාහ දැරීම ගැන අපි ඔබ සමඟ සාකච්ඡා කරමු.

## සම්මුතියකට පැමිණීම

- සම්මුතිය යනු ඔබ පැමිණිලිකරන සංවිධානයට හෝ පුද්ගලයා සමඟ ප්‍රශ්නය විසඳා ගැනීමට අපි ඔබට උපකාර කිරීමට උත්සාහ කිරීමයි.
- සම්මුතියකට පැමිණීම 'සම්මුති සාකච්ඡාව' යන මුහුණට මුහුණ පැවැත්වෙන හමුවක් මගින් හෝ දුරකථන හමුවීමක් මගින් සිදු කළ හැක. සමහර අවස්ථාවල පැමිණිලි ලිපි හුවමාරු කිරීම මගින් හෝ මැදිහත්කරුවකු මගින් දුරකථනය හෝ ඊමේල් මගින් පනිවුඩ යැවීමෙන් විසඳා ගත හැක.
- පැමිණිලි ක්‍රම ගණනාවකින් විසඳා ගත හැක. නිදසුනක් වශයෙන් කණගාටුව ප්‍රකාශ කිරීමෙන්, ප්‍රතිපත්තියක් හෝ චන්දියක් වෙනස් කිරීම දැක්විය හැක.

## ගත හැකි අධිකරණ ක්‍රියා මාර්ග - ලිංගිකත්වය අනුව, ආබාධිත බව අනුව, ජාතිය සහ වයස අනුව වෙනස් ආකාරයෙන් සැලකීම

- කොමිසමට නීති විරෝධී වෙනස් ආකාරයෙන් සැලකීමක් සිදුව ඇත්දැයි තීරණය කිරීමට බලය නැත.
- ඔබේ පැමිණිල්ල විසඳුවේ නැත්නම් හෝ වෙනත් හේතුවක් නිසා නවත්වා දැමුවහොත් ඔබට ගැටළුව අධිකරණය වෙත ගෙන යා හැක. නීති විරෝධී ලෙස පහත් කොට සැලකීමක් සිදුව ඇත්දැයි අධිකරණයට තීරණය කළ හැක.
- මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් කොමිෂන් සභාව අවසාන වශයෙන් කටයුතු කිරීමේදී ඕස්ට්‍රේලියාවේ Federal Circuit Court වෙත හෝ Federal Court of Australia වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට ඔබට දින 60ක කාලයක් ඇත.
- ඔබ වෙනුවෙන් ප්‍රශ්නය අධිකරණය වෙත ගෙන යාමට හෝ ඔබේ සිද්ධිය අධිකරණයට ඉදිරිපත් කිරීමට උපකාර කිරීමට කොමිසමට නොහැක.
- ඔබ අධිකරණය හමුවට ගියහොත් නීතිඥවරයකු හෝ නීති නියෝජිතයකු හා කතා කිරීමට ඔබට සිදු විය හැක.

## තීරණය/වාර්තාව– ILO III වෙනස් ආකාරයට සැලකීම සහ මානව හිමිකම්

- කිසියම් හේතුවක් මත පැමිණිල්ල නොවිසඳුනහොත් හෝ අබණ්ඩව විභාග නොකෙරුනහොත්, කොමිෂන් සභාවේ සභාපතිවරයා ILO III වෙනස් ආකාරයකට සැලකීමක් හෝ මානව හිමිකම් උල්ලංඝනය වීමක් හෝ සිදුව ඇත්දැයි තීරණය කරයි. මීට සභාපතිවරයා විසින් පවත්වනු ලබන එක් එක් පක්ෂයට සිද්ධියේ තම අවස්ථා, පිළිතුරු සහ ප්‍රශ්න ඉදිරිපත් කිරීමට කිරීමට අවස්ථාව සැලසෙන ප්‍රසිද්ධ විභාගයක් ඇතුළත් වනු ඇත.

- වෙනස් ආකාරයකට සැලකීමක්, මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇති බවට සභාපතිවරයා සෑහීමකට පත් වුවහොත්, සභාපතිවරයා විසින් එම කරුණ රජයේ ඇටෝර්නි ජෙනරාල්වරයා වෙත වාර්තා කරනු ඇත. මෙම වාර්තාවේ, පුද්ගලයා අත්විඳ ඇති කිසියම් පාඩුවක් හෝ තුවාලයක් සඳහා වන්දි ගෙවීම නිර්දේශ කිරීම සභාපතිවරයාට සිදු කළ හැකිය. වාර්තාව අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.

- වෙනස් ආකාරයට සැලකීම සහ මානව හිමිකම් සම්බන්ධයෙන් සභාපතිවරයාගේ තීරණවලට නිදසුන් http://www.humanrights.gov.au/publications/reports-minister-under-ahrc-act හි කොමිෂන් සභා වෙබ් අඩවියේ තිබේ.

## වැඩි විස්තර ලබා ගැනීමට මා යා යුතේත් කොතැනටද?

පහත ආකාරයට ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිෂන් සභාව හා සම්බන්ධ විය හැකිය.

### දුරකථනය

| | |
|---|---|
| පැමිණිලි තොරතුරු මාර්ගය: | 1300 656 419 (දේශීය ඇමතුම්) |
| TTY: | 1800 620 241 |
| NRS: | 133 677 |
| ෆැක්ස්: | (02) 9284 9611 |

ඔබ භාෂණ පරිවර්තකයෙකු ලබා ගැනීමට කැමත් නම් ඔබට **131 450** අමතා ඕස්ට්‍රේලියානු මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සම්බන්ධ කරන ලෙස ඉල්ලා සිටිය හැකිය.

ඔබ බිහිරි නම් හෝ කිසියම් ශ්‍රවණ ආබාධයක් ඇති අයෙකු නම් ඔබට 1800 620 241 ඔස්සේ TTY මගින් අප ඇමතිය හැකිය. ඔබ බිහිරි නම් හෝ කථන ආබාධයක් ඇති අයෙකු නම් ඔබට ජාතික සහන සේවා (NRS) මගින් 133 677 ඔස්සේ අප ඇමතිය හැකිය. ඔබට ඕස්ලන් භාෂණ පරිවර්තකයෙකු අවශ්‍ය නම්, කොමිෂන් සභාවට මෙම අවශ්‍යතාව සපුරා දිය හැකිය.

ඔබ අන්ධ නම් හෝ දෘශ්‍ය ආබාධ සහිත අයෙකු නම්, කොමිෂන් සභාවට ඉල්ලීම අනුව විකල්ප ආකෘතිපත්වලින් තොරතුරු ලබා දිය හැකිය.

### තැපැල්

තැපැල්
Australian Human Rights Commission
GPO Box 5218
Sydney NSW 2001

### මාර්ගගත

| | |
|---|---|
| ඊමේල්: | complaintsinfo@humanrights.gov.au |
| වෙබ් අඩවිය: | www.humanrights.gov.au |

ඔබට පහත පිටුව වෙත ගොස් මාර්ගගතව පැමිණිල්ලක් සිදු කළ හැකිය
http://www.humanrights.gov.au/complaints/lodging-your-complaint.

### සාමාන්‍ය නීති උපදේශය

ඔබ පැමිණිල්ලක් සිදු කිරීමට අදහස් කරනේන් නම්, ඔබට නීති උපදෙස් ලබා ගැනීමට හෝ ප්‍රජා ආයතනයක් හා සම්බන්ධ වීමට අවශ්‍ය විය හැකිය. වෙනස් ආකාරයට සැලකීම සහ හිංසා කිරීම් පිළිබඳව නොමිලේ උපදෙස් ලබා ගත හැකි ප්‍රජා නීති සේවා තිබේ. ආසන්නයේම පිහිටා ඇති ප්‍රජා නීති මධ්‍යස්ථානය පිළිබඳ තොරතුරු www.naclc.org.au/directory වෙතින් ලබා ගත හැකිය.

**වගකීමෙන් බැහැර කිරීම: මෙම තොරතුරු පත්‍රිකාව පිළිබඳ තොරතුරු මාරේගෝපදේශයක් ලෙස පමණක් යොදා ගැනීමට අපේක්ෂා කෙරේ. එය නීති උපදෙස් සඳහා ආදේශකයක් නොවේ.**